# ථේරවාද භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය කුඩාකත්නෝරුවේ විනීත හිමි
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
kathnoruwe@sjp.ac.lk

බුද්ධ ශාසනය විනය හා ධර්මය මත පදනම් වූවකි. එයට අමතරව කාල දේශානුරූපීව ශාසනයෙහි උපන් විවිධ හේතු මත ලක්දිව ශාසනෝන්නතිකාමීන් විසින් ශාසන කතිකාවත් සම්මත කොටගෙන තිබේ. කතිකාවතක් යනු භික්ෂූන් වහන්සේලා ඒකරාශි වී සංඝයාගේ පාරිශුද්ධියත් සාමග්‍රියත් උදෙසා සාමූහිකව ගන්නා ලද සම්මුති හෙවත් සංඝ සම්මත වූ ව්‍යවස්ථාවන් ය. වර්තමානයේ ද ඇතැම් නිකාය, පාර්ශ්ව හෝ විහාර කතිකාවත් දක්නට ලැබේ. භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත යනු කතිකාවතක් නොව කතිකාවත් සකස් කොට ලියාපදිංචි කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික අවසර ලබාදීම සඳහා සකස් වූ පාර්ලිමේන්තු යෝජනාවකි. එයින් සංඝයාගේ පාරිශුද්ධියත් සාමග්‍රියත් උදෙසා අවශ්‍ය පසුබිම සකස් වන්නේ ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටළුව වේ. යෝජිත භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත, පැරණි ශාසනික කතිකාවත් ආදී ලිඛිත මූලාශ්‍රය මෙන්ම නිකාය තුනට අයත් භික්ෂූන් වහන්සේලා සැට දෙනෙකුගේ නියැදියකින් ලබාගන්නා දත්ත විශ්ලේශණය ක්‍රමවේදය වේ.
ලක්දිව ශාසන ඉතිහාසයේ සම්මත කොටගෙන ඇති කතිකාවත්වලට රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇත. ඒ අනුව යම් නෛතික බලයක් ද ඒවාට හිමි වී තිබේ. ඒ අනුව රාජ්‍යය හා භික්ෂූන් වහන්සේලා එක්ව ශාසන විලෝපයන් සමනයට හා සාමග්‍රියට කටයුතු කොට ඇති බව පෙනේ. එහෙත් අපගේ විමසුමට අනුව භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත පැහැදිලිව නිකාය හා පාර්ශ්ව වෙන්ව හඳුනාගන්නා අතර ඔවුන්ට කැමති පරිදි භික්ෂූන්ගේ චර්යාවන් පිළිබඳ විධිවිධාන සකස් කිරීමට අවසර හිමි වේ. ධර්ම-විනයානුකූල වියයුතු බව කියැවෙන නමුත් විනයෙහි සංග්‍රහ නොවන නූතන ප්‍රවනතාවන් විෂයෙහි තීරණ ගැනීමේ අවසර හිමිවේ. රියදුරු බලපත්‍ර ලබාගැනීම පිළිබඳ වාදය එවැන්නකි. යොදජගත් නියැදිය අනුව සාතිශය බහුතරයකට මෙම පනත පිළිබඳව අවබෝධයක් නොමැත. සුළු පිරිසක් ඒ පිළිබඳව දන්නා නමුත් එහි අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනය කොට නොමැත. අවබෝධයෙන් සිටින ඇතැම් අය මෙය ශාසනික යහපැවැත්මට හානිකර ලෙස දකී. සුළු පිරිසක් එය අගය කරයි. අතීත කතිකාවත් මගින් පොදු සම්මුති තහවුරු කරගැනීමට කතිකාවත යොදාගෙන ඇත.
කතිකාවත් පනතක අවශ්‍යතාව සාතිශය බහුතරය පිළිගනී. එහෙත් සම්මත කරගත යුතු හෝ වෙනස් වි යුතු කාරනාවන් පිළිබඳ නිශ්චිත අදහසක් නොමැත. ධර්ම-විනයට අනුකූලව පනත් සකස් කළයුතු බව සඳහන් වෙතත් නූතන ප්‍රවනතාවන්ට පිළිතුරුදීමේ දී ගැටලු සහගත තත්ත්වයක් හටගනී. එමෙන් ම විවිධ තනතුරු හා විෂය දැනුම පදනම් කොටගත් ගිහි පිරිස් බඳවා ගැනීමෙන් භික්ෂූන සම්බන්ධ තීරණ ගැනීමට ගිහියන්ගේ සම්බන්ධ වීම නොවටී. පනත් නීතිගත කිරීමෙන් නීති ක්‍රියාත්මක කිරීමේ බලයක් නිකාටය හෝ පාර්ශ්වයට හිමිවේ. එහෙත් ඒ පිළිබඳ ප්‍රාමාණික දැනුමැති අයගේ තීරණ නිසා වෙනත් අර්බුද හටගනී. එටහයින් ශාසනයේ පැවැත්ම හා සාමග්‍රිය උදෙසා මෙම යෝජනාව අනුබල නොදෙන බව පැහැදිලිය.

**ප්‍රමුඛ පද:** කතිකාවත ; විනය; භික්ෂුව; ශාසනය; නව ප්‍රවණතා